# සතිපතා ආර්ථික දර්ශක



## 2025 අගෝස්තු 15

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# සතියේ සුවිශේෂී කරුණු

## මූර්ත අංශය

2025 වසරේ පළමු භාගයේ දී තේ නිෂ්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ යෑමක් වාර්තා කළ අතර, අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ජූනි මාසයේ තේ නිෂ්පාදනය පහළ ගියේය. පවතින තාවකාලික දත්තවලට අනුව, රබර් නිෂ්පාදනය මෙම කාලපරිච්ඡේදය තුළ දී පහළ යෑමක් වාර්තා කර ඇත. 2025 වසරේ ජූනි මාසයේ දී පොල් නිෂ්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා කරමින් යථා තත්ත්වයට පත් වීමක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, 2025 වසරේ පළමු භාගය තුළ දී පොල් නිෂ්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පහළ මට්ටමක පැවතුණි.

2025 ජූනි මාසයේ දී කාර්මික නිෂ්පාදන දර්ශකය, 2024 ජූනි මාසයට සාපේක්ෂව 98.5ක් දක්වා සියයට 6.2කින් ඉහළ ගියේය. මේ සඳහා, ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන සියයට 35.4කින්, ඇඟලුම් නිෂ්පාදන සියයට 24.0කින් සහ ලෝහමය නොවන වෙනත් ඛණිජ නිෂ්පාදන සියයට 20.2කින් ඉහළ යෑම බලපෑවේය.

2025 ජූලි මාසයේ දී, ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සහ සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි.

2025 වසරේ අගෝස්තු 11 සිට අගෝස්තු 15 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී, බොරතෙල් මිල ගණන් මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. ගෝලීය වෙළඳ සහ දේශපාලන අවිනිශ්චිතතාවයන් මධ්‍යයේ මිල ඉහළ ගියද, ගිම්හාන ඉල්ලුම අවසන් වීම සමඟ පරිභෝජනය පහත වැටීමේ අපේක්ෂාවන් සහ ඉහළ ගිය එක්සත් ජනපද බොරතෙල් සංචිත මගින් තව දුරටත් මිල ඉහළ යෑම සීමා විය. සමස්තයක් ලෙස, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි බොරතෙල් බැරලයක මිල, පිළිවෙළින්, එ.ජ. ඩොලර් 0.65කින් සහ එ.ජ. ඩොලර් 0.53කින් ඉහළ ගියේය.

## මුදල් අංශය

සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR) පෙර සතිය හා සැසඳීමේ දී 2025 අගෝස්තු මස 15 වන දිනෙන් අවසාන වන සතිය සඳහා පදනම් අංක 16කින් සියයට 8.09ක් දක්වා පහළ ගියේය.

බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) පෙර සතියේ අග පැවති සියයට 7.85ට සාපේක්ෂව 2025 අගෝස්තු මස 15 වන දින සියයට 7.86ක් විය.

සංසරණයේ පවතින මුදල් ප්‍රමාණය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන පසුගිය සතියට සාපේක්ෂව සංචිත මුදල් ඉහළ ගියේය.

සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව පෙර සතියේ අග පැවති රුපියල් බිලියන 88.52ක අතිරික්තයට සාපේක්ෂව මෙම සතියේ දී රුපියල් බිලියන 88.33ක අතිරික්තයක් විය.

පසුගිය සතිය හා සැසඳීමේ දී 2025 අගෝස්තු මස 15 දින වන විට, සමස්ත කොටස් මිල දර්ශකය සියයට 1.98කින් දර්ශක අගය 20,218.36ක් දක්වා ඉහළ ගිය අතර, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය සියයට 1.19කින් දර්ශක අගය 5,894.84ක් දක්වා ඉහළ ගියේය.

## රාජ්‍ය මූල්‍ය අංශය

සතිය තුළ දී, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර ඵලදා අනුපාතික පුළුල් ලෙස ස්ථාවරව පැවතුණි.

පසුගිය සතියට සාපේක්ෂව, මෙම සතිය තුළ දී අනේවාසිකයන් සතු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයෙහි රුපියල් අගය ස්ථාවරව පැවතුණි.

මෙම සතිය තුළ දී පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ප්‍රමාණය මෙන් දෙගුණයකි.

පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළ දී භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මුළු ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය සියයට 9ක ප්‍රතිශතයකින් පහළ යෑමක් දක්නට ලැබේ.

## විදේශීය අංශය


2025 වසරේ අගෝස්තු 15 වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 2.8කින් අවප්‍රමාණය විය.

# මූර්ත අංශය

## 1.1 මිල දර්ශක


| ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) (2021=100) | 2024 | 2025 | |
|---|---|---|---|
| | ජූනි | මැයි | ජූනි |
| මතුපිට උද්ධමනය - ( ජා. පා. මි. ද. ) | 208.1 | 207.5 | 208.7 |
| මාසික ප්‍රතිශත වෙනස % | 0.9 | 0.5 | 0.6 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 3.0 | (0.8) | (0.9) |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 2.4 | 0.6 | 0.3 |
| මූලික උද්ධමනය - ( ජා. පා. මි. ද. ) | 193.7 | 194.2 | 194.8 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 2.7 | 1.2 | 0.9 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 3.9 | 0.3 | 0.6 |

ජා.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) (2021=100) | 2024 | 2025 | |
|---|---|---|---|
| | ජූලි | ජූනි | ජූලි |
| මතුපිට උද්ධමනය - ( කො. පා. මි. ද. ) | 194.7 | 194.5 | 194.1 |
| මාසික ප්‍රතිශත වෙනස % | (0.5) | 0.9 | (0.2) |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 2.8 | (1.4) | (1.6) |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 2.4 | (0.6) | (0.3) |
| මූලික උද්ධමනය - ( කො. පා. මි. ද. ) | 177.9 | 180.1 | 180.8 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 2.7 | 2.1 | 1.9 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 4.4 | 1.5 | 1.6 |

කො.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.2 මිල

### 1.2.1 පිටකොටුව වෙළඳපොළ

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | | | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 230.00 | 235.00 | 238.00 | 235.60 | 240.00 | 240.00 | 250.00 | 250.00 |
| රතු කැකුළු | 193.00 | 203.00 | 203.00 | 202.60 | 210.00 | 220.00 | 220.00 | 220.00 |
| | | | | | | | | |
| බෝංචි | 340.00 | 430.00 | 562.50 | 480.00 | 390.00 | 480.00 | 612.50 | 530.00 |
| ගෝවා | 212.00 | 214.00 | 177.50 | 172.00 | 262.00 | 264.00 | 227.50 | 222.00 |
| කැරට් | 230.00 | 280.00 | 287.50 | 340.00 | 280.00 | 330.00 | 337.50 | 390.00 |
| තක්කාලි | 180.00 | 78.00 | 120.00 | 110.00 | 230.00 | 116.00 | 170.00 | 162.00 |
| වට්ටක්කා | 150.00 | 116.00 | 62.50 | 52.00 | 200.00 | 166.00 | 105.00 | 100.00 |
| පතෝල | 188.00 | 126.00 | 195.00 | 180.00 | 226.00 | 176.00 | 245.00 | 230.00 |
| වම්බටු | 220.00 | 270.00 | 325.00 | 310.00 | 270.00 | 320.00 | 375.00 | 360.00 |
| අමු මිරිස් | 240.00 | 380.00 | 175.00 | 106.00 | 290.00 | 430.00 | 225.00 | 156.00 |
| දෙහි | 420.00 | 196.00 | 162.50 | 200.00 | 520.00 | 246.00 | 212.50 | 250.00 |
| | | | | | | | | |
| රතු ළූණු ( දේශීය) | 279.80 | 369.40 | 241.50 | 249.40 | 375.00 | ලැ.නො. | 300.00 | 300.00 |
| ලොකු ළූණු ( ආනයනික) | 199.80 | 84.80 | 100.00 | 118.20 | 227.60 | 120.00 | 140.00 | 148.00 |
| අර්තාපල් ( දේශීය) | 394.60 | 328.00 | 322.50 | 282.60 | 463.00 | 394.00 | 400.00 | 310.00 |
| වියළි මිරිස් ( ආනයනික) | 775.00 | 532.60 | 518.75 | 525.00 | 850.00 | 600.00 | 600.00 | 600.00 |
| රතු පරිප්පු | 274.00 | 245.00 | 245.00 | 245.00 | 300.00 | 270.00 | 270.00 | 270.00 |
| බිත්තර-සුදු ( ඒකක මිල) | 36.00 | 28.00 | 31.50 | 30.60 | 36.50 | 28.50 | 32.00 | 31.10 |
| පොල් ( ගෙඩියක මිල) | 99.60 | 139.00 | 165.00 | 160.00 | 120.00 | 183.00 | 175.00 | 175.00 |

### 1.2.2 මරදගහමුල සහල් මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සහල් තොග මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|
| | පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 219.80 | 233.60 | 231.75 | 231.00 |
| සුදු කැකුළු | 197.40 | 199.60 | 198.00 | 198.80 |
| රතු කැකුළු | 190.60 | 201.60 | 193.75 | 191.00 |
| නාඩු | 202.40 | 211.60 | 207.00 | 204.00 |

ලැ.නො. - ලැබී නොමැත.

## 1.2.3 දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය


| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 239.00 | 239.00 |
| රතු කැකුළු | 215.00 | 215.00 |
| බෝංචි | 517.50 | 430.00 |
| ගෝවා | 163.75 | 144.00 |
| කැරට් | 316.25 | 406.00 |
| තක්කාලි | 72.50 | 66.60 |
| වට්ටක්කා | 47.75 | 35.20 |
| පතෝල | 108.75 | 123.00 |
| වම්බටු | 218.75 | 230.00 |
| අළු කෙසෙල් | 62.50 | 64.00 |
| රතු ළූණු ( දේශීය) | 153.75 | 183.00 |
| රතු ළූණු ( ආනයනික) | 176.25 | 228.33 |
| ලොකු ළූණු ( ආනයනික) | 109.50 | 114.20 |
| අර්තාපල් ( දේශීය) | 265.00 | 271.00 |
| අර්තාපල් ( ආනයනික) | 144.00 | 156.40 |
| වියළි මිරිස් ( ආනයනික) | 545.00 | 549.00 |
| පොල් ( ගෙඩියක මිල) | 118.75 | 138.60 |

## 1.2.4 නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය


| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | පසුගිය සතිය | මෙම සතිය |
| සුදු නාඩු | 230.00 | 230.00 |
| රතු කැකුළු | 210.00 | 218.00 |
| බෝංචි | 715.00 | 660.00 |
| ගෝවා | 350.00 | 368.00 |
| කැරට් | 440.00 | 592.00 |
| තක්කාලි | 205.00 | 196.00 |
| වට්ටක්කා | 115.00 | 132.00 |
| පතෝල | 310.00 | 400.00 |
| වම්බටු | 460.00 | 468.00 |
| අමු මිරිස් | 540.00 | 416.00 |
| රතු ළූණු ( දේශීය) | ලැනො. | ලැනො. |
| ලොකු ළූණු ( ආනයනික) | 140.00 | 164.00 |
| අර්තාපල් ( දේශීය) | 440.00 | 356.00 |
| අර්තාපල් ( ආනයනික) | 200.00 | 230.00 |
| වියළි මිරිස් ( ආනයනික) | 800.00 | 760.00 |
| රතු පරිප්පු | 280.00 | 268.00 |
| සුදු සීනි | 240.00 | 240.00 |
| බිත්තර- සුදු ( ඒකක මිල) | 32.00 | 32.60 |
| පොල් ( ගෙඩියක මිල) | 165.00 | 200.00 |

### නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය - සිල්ලර මිල


බෝංචි





වම්බටු





සුදු නාඩු




කෙලවල්ලා මාළු




පොල්




## 1.2.5 මාළු වෙළඳපොළ


| | පෑලියගොඩ | | මීගමුව | | | | නාරාහේන්පිට | |
|---|---|---|---|---|---|---|---|---|
| | තොග මිල ගණන්හි සාමාන්‍යය | | තොග මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
| | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය |
| කෙලවල්ලා | 1,287.50 | 1,530.00 | 1,150.00 | 1,200.00 | 1,740.00 | 1,790.00 | 2,310.00 | 2,528.00 |
| බලයා | 783.33 | 1,037.50 | 850.00 | ලැනො. | 1,050.00 | ලැනො. | 1,200.00 | 1,230.00 |
| සාලයා | 350.00 | 490.00 | 377.50 | 460.00 | 512.50 | 606.00 | 500.00 | 676.00 |
| හුරුල්ලා | 787.50 | 816.67 | 715.00 | 870.00 | 905.00 | 1,090.00 | 1,050.00 | ලැනො. |

ලැනො. - ලැබී නොමැත.

## 1.3 කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2015 ස්ථාවර මිල අනුව) - එකතු කළ අගය මත වර්ධන අනුපාතිකය

| අයිතමය | වාර්ෂික | | පළමුවන කාර්තුව | |
|---|---|---|---|---|
| | 2023 (අ)(ආ) | 2024 (ආ) | 2024(අ)(ආ) | 2025 (ආ) |
| කෘෂිකාර්මික | 1.6 | 1.2 | 0.9 | (0.7) |
| කාර්මික | (9.2) | 11.0 | 11.2 | 9.7 |
| සේවා | (0.2) | 2.4 | 2.5 | 2.8 |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු -සහනාධාර | 2.6 | 10.6 | 9.6 | 8.3 |
| දළ දේශීය නිෂ්පාදිතය | (2.3) | 5.0 | 5.1 | 4.8 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.4 කෘෂිකාර්මික නිෂ්පාදනය

| අයිතමය | ජූනි | | % වෙනස |
|---|---|---|---|
| | 2024 (අ) | 2025 (අ) | |
| තේ (කි.ග්‍රෑ මිලියන) | 23.2 | 21.7 | (6.3) |
| රබර් (කි.ග්‍රෑ මිලියන) | 5.6 | 4.6 | (19.2) |
| පොල් (ගෙඩි මිලියන) | 244.6 | 289.5 | 18.3 |

(අ) තාවකාලික





මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය
රබර් සංවර්ධන මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය

## 1.5 කාර්මික නිෂ්පාදන දර්ශකය (කා.නි.ද) (2015=100) (අ)

| අයිතමය | ජූනි | | % වෙනස |
|---|---|---|---|
| | 2024 (ආ) | 2025 (ඇ) | |
| කාර්මික නිෂ්පාදන දර්ශකය | 92.7 | 98.5 | 6.2 |
| ආහාර නිෂ්පාදන | 103.0 | 100.3 | (2.6) |
| ඇඟලුම් නිෂ්පාදන | 82.0 | 101.7 | 24.0 |
| අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන | 93.8 | 112.7 | 20.2 |
| පිරිපහදුකළ ඛනිජතෙල් නිෂ්පාදන | 80.7 | 109.3 | 35.4 |
| රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 80.4 | 76.1 | (5.3) |
| රසායනික ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන | 80.1 | 80.2 | 0.1 |
| පාන වර්ග | 116.5 | 122.0 | 4.7 |

(අ) ප්‍රධාන උප අංශ 7
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


## 1.6 ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (අ)


| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නිෂ්පාදන | 2024 | | 2025 | |
|---|---|---|---|---|
| | ජූනි | ජූලි | ජූනි | ජූලි |
| දර්ශකය | 56.6 | 59.5 | 51.9 | 62.2 |


| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - සේවා | 2024 | | 2025 | |
|---|---|---|---|---|
| | ජූනි | ජූලි | ජූනි | ජූලි |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය | 63.5 | 71.1 | 61.9 | 70.1 |

| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - ඉදිකිරීම් | 2024 | | 2025 | |
|---|---|---|---|---|
| | මැයි | ජූනි | මැයි | ජූනි |
| සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය | 54.5 | 59.5 | 59.7 | 58.6 |

(අ) පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, සේවා සහ ඉදිකිරීම් ක්‍රියාකාරකම් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ මූලික දර්ශක ලෙස පිළිවෙළින්, සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සහ ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය සැලකෙන අතර, නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, උප-දර්ශක පහක භරිත සාමාන්‍යයක් ලෙස ගණනය කරනු ලැබේ. තවද, සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සහ ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය හා සැසඳිය හැකිය.







## 1.7 සේවා නියුක්තිය [(අ)]

| අයිතමය | 2024 | 2024 කාර්තු:1 | 2025 කාර්තු:1 |
|---|---|---|---|
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය | 47.4 | 47.1 | 49.7 |
| සේවා වියුක්ති අනුපාතිකය | 4.4 | 4.5 | 3.8 |

**අංශය අනුව සේවා නියුක්ත පුද්ගලයන්[(ආ)] (මුළු සේවා නියුක්තියෙන් ප්‍රතිශතයක් ලෙස)**


| | 2024 | 2024 කාර්තු:4 | 2025 කාර්තු:1 |
|---|---|---|---|
| කෘෂිකර්මාන්ත | 26.0 | 26.8 | 23.4 |
| කර්මාන්ත | 25.6 | 25.7 | 26.2 |
| සේවා | 48.5 | 47.6 | 50.3 |




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.8 වැටුප් ප්‍රමාණ දර්ශක


| අයිතමය | 2024 ජූනි | 2025 ජූනි | වෙනස % |
|---|---|---|---|
| රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016 = 100) - නාමික | 161.3 | 183.4 | 13.7 |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018 = 100) - නාමික | 180.6 | 190.2 | 5.3 |
| කෘෂිකර්මාන්ත | 181.0 | 191.8 | 5.9 |
| කර්මාන්ත | 179.6 | 189.5 | 5.5 |
| සේවා | 182.5 | 190.1 | 4.1 |





## 1.9 බොරතෙල් සාමාන්‍ය මිල

| මාසය | 2024 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2024 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2024 ලං.ඛ.නි.සං. ආනයන මිල (මි.ර.ගැ.) (බැරලයක් එ.ජ. ඩොලර්) (ඇ) (ඈ) | 2025 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2025 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2025 ලං.ඛ.නි.සං. ආනයන මිල (මි.ර.ගැ.) (බැරලයක් එ.ජ. ඩොලර්) |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 78.93 | 73.64 | 91.48 | 77.90 | 74.77 | 76.14 |
| පෙබරවාරි | 81.48 | 76.53 | 81.33 | 75.12 | 71.37 | 76.32 |
| මාර්තු | 84.57 | 80.23 | 82.76 | 71.41 | 67.88 | 83.33 |
| අප්‍රේල් | 88.99 | 84.47 | 86.00 | 66.96 | 63.54 | 83.47 |
| මැයි | 83.28 | 78.97 | 88.49 | 63.96 | 60.86 | 75.75 |
| ජූනි | 82.58 | 78.42 | 92.88 | 70.13 | 68.14 | 70.79 |
| ජූලි | 84.14 | 80.85 | 87.57 | 69.29 | 66.94 | |
| අගෝස්තු | 79.03 | 75.71 | - | | | |
| සැප්තැම්බර් | 73.27 | 69.93 | 87.38 | | | |
| ඔක්තෝබර් | 75.29 | 71.55 | 81.75 | | | |
| නොවැම්බර් | 73.51 | 69.73 | 76.72 | | | |
| දෙසැම්බර් | 73.02 | 69.57 | 77.50 | | | |

| දිනය | 2024 | | 2025 | |
|---|---|---|---|---|
| 09-08 | 79.21 | 76.24 | - | - |
| 10-08 | - | - | - | - |
| 11-08 | - | - | 66.13 | 63.34 |
| 12-08 | 79.81 | 77.12 | 66.75 | 64.03 |
| 13-08 | 81.82 | 79.58 | 66.09 | 63.09 |
| 14-08 | 80.99 | 78.72 | 65.89 | 62.88 |
| 15-08 | 79.78 | 77.08 | 66.78 | 63.87 |





මූලයන්: බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## 1.10 දෛනික විදුලිබල උත්පාදනය

| | 2025-08-11 | 2025-08-12 | 2025-08-13 | 2025-08-14 |
|---|---|---|---|---|
| උපරිම ඉල්ලුම (මෙ. වො.) | 2,593.60 | 2,620.80 | 2,682.10 | 2,679.30 |
| මුළු උත්පාදනය (ගි. වො. පැ.) | 50.35 | 50.61 | 52.09 | 52.22 |
| ජල (ගි. වො. පැ.) | 22.28 | 22.10 | 20.94 | 21.46 |
| ගල් අඟුරු (ගි. වො. පැ.) | 13.06 | 12.97 | 12.98 | 12.53 |
| තෙල් (ගි. වො. පැ.) | 5.74 | 5.01 | 6.24 | 5.92 |
| සුළං (ගි. වො. පැ.) | 3.47 | 4.12 | 3.85 | 4.28 |
| සූර්ය (තොග) (ගි. වො. පැ.) | 5.69 | 6.24 | 7.96 | 7.81 |
| ජෛව ස්කන්ධය (ගි. වො. පැ.) | 0.11 | 0.18 | 0.12 | 0.21 |




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය


(අ) කුටුම්භ ජනගහනය අවුරුදු 15 සහ ඊට වැඩි
(ආ) ජාත්‍යන්තර ප්‍රමිති වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ.
(ඇ) ලං.ඛ.නි.සං. ආනයන මිල ගණන්වලට ගැල් කුලී ඇතුළත් වීම සහ එය විවිධ බොරතෙල් වර්ගවල සාමාන්‍ය මිල ගණන් අනුව බර තබන ලද මිලක් වන බැවින් ලං.ඛ.නි.සං. ආනයන මිල, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. ඉදිරි වෙළඳපොළ මිල ගණන් සමඟ සෘජුව සැසඳිය නොහැකිය. එසේම, ලං.ඛ.නි.සං. ආනයනවලින් කොටසක් කාලීන ගිවිසුම් මත පදනම් වේ. 2023 වසරේ පෙබරවාරි, සැප්තැම්බර් සහ 2024 අගෝස්තු යන මාසවල දී බොරතෙල් ආනයනය කර නැත.
(ඈ) තාවකාලික

# මුදල් අංශය

## 2.1 පොලී අනුපාතික (වාර්ෂික අනුපාතය ප්‍රතිශතයක් ලෙස)

| ප්‍රතිපත්ති පොලී අනුපාතිකය | වසරකට පෙර | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|---|
| එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR) [(අ)] | - | 7.75 | 7.75 |
| **නිත්‍ය පහසුකම් අනුපාතික [(අ)]** | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 8.25 | 7.25 | 7.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 9.25 | 8.25 | 8.25 |
| **ඒක්ෂණ මුදල් වෙළඳපොළ** | | | |
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) (සතිය අවසානයට) | 8.57 | 7.85 | 7.86 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | |
| දින 91 | 9.39 | 7.61 | 7.60 |
| දින 182 | 9.68 | 7.91 | 7.90 |
| දින 364 | 10.03 | 8.03 | 8.03 |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | | | |
| බරිත සාමාන්‍යය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR) | 9.07 | 8.25 | 8.09 |

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය




| | 2024 ජූනි | 2025 මැයි | 2025 ජූනි |
|---|---|---|---|
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.25 - 9.00 | 0.25 - 9.00 | 0.25 - 9.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 2.50 - 21.00 | 2.50 - 12.00 | 2.50 - 12.00 |

| | 2024 ජූනි | 2025 මැයි | 2025 ජූනි |
|---|---|---|---|
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 8.38 | 6.98 | 6.93 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 10.39 | 8.56 | 8.52 |

| | 2024 ජූනි | 2025 මැයි | 2025 ජූනි |
|---|---|---|---|
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 7.24 | 6.23 | 6.26 |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 7.32 | 6.62 | 6.85 |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR) | 12.47 | 11.67 | 11.56 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR) | 11.45 | 10.56 | 10.28 |

| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2024 ජූනි | 2025 මැයි | 2025 ජූනි |
|---|---|---|---|
| ඉතිරිකිරීමේ තැන්පතු | 3.00 | 3.00 | 3.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 7.75 | 6.75 | 6.75 |

| භාණ්ඩාර බැඳුම්කර වෙන්දේසිය | වසර 06 මාස 05 2025 අගෝ 12 | වසර 09 මාස 10 2025 අගෝ 12 |
|---|---|---|
| පොලී අනුපාතිකය | 8.00 | 10.70 |
| බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය | - | 10.97 |

### බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව


| | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|
| ලංකා බැංකුව | 8.45 | 8.49 |
| මහජන බැංකුව | 8.50 | 8.02 |
| හැටන් නැෂනල් බැංකුව | 8.32 | 8.23 |
| කොමර්ෂල් බැංකුව | 8.69 | 8.82 |
| සම්පත් බැංකුව | 8.15 | 7.74 |
| සෙලාන් බැංකුව | 8.98 | 8.91 |
| යූනියන් බැංකුව | 8.74 | 8.36 |
| පැන් ඒෂියා බැංකුව | 7.57 | 8.52 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 7.94 | 8.19 |
| ඩීඑෆ්සීසී බැංකුව | 9.35 | 9.22 |
| එන්ඩීබී බැංකුව | 9.00 | 7.69 |
| අමානා බැංකුව | 7.35 | 7.50 |


| | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|
| කාර්ගිල්ස් බැංකුව [(ආ)] | 8.64 | 8.64 |
| එච්එස්බීසී බැංකුව | 8.30 | 8.44 |
| ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව | 7.90 | 7.96 |
| සිටි බැංකුව [(ආ)] | 8.25 | 8.25 |
| ඩොයිෂ් බැංකුව | 9.70 | 7.40 |
| හබීබ් බැංකුව [(ආ)] | 8.02 | 8.02 |
| ඉන්දියන් බැංකුව | 9.06 | 9.02 |
| ඉන්දියන් ඕවර්සීස් බැංකුව [(ආ)] | 8.52 | 8.52 |
| එම්සීබී බැංකුව [(ආ)] | 8.02 | 8.02 |
| ඉන්දීය රාජ්‍ය බැංකුව | 9.14 | 9.75 |
| පබ්ලික් බැංකුව | 9.35 | 7.75 |
| බැන්ක් ඔෆ් චයිනා | - | - |


(අ) 2024 නොවැම්බර් 27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ලෙස අර්ථ දැක්වේ. පදනම් අංක ± 50 ආන්තික සමඟ, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සම්බන්ධ කෙරේ.
(ආ) බැංකුව විසින් මෙම සතිය තුළ දී ප්‍රමුඛ ගණුදෙනුකරුවන් හට කිසිදු ණය පහසුකමක් ලබා දී නොමැත. එබැවින් ආසන්නතම සතියට අදාළ ණය අනුපාතිකය සඳහන් කර ඇත.

## 2.2 මුදල් සැපයුම

| | රු. බිලියන | | | වාර්ෂික වෙනස (%) | | |
|---|---|---|---|---|---|---|
| | ජූනි 2024 | මැයි 2025 | ජූනි 2025[අ] | ජූනි 2024 | මැයි 2025 | ජූනි 2025[අ] |
| සංචිත මුදල් | 1,417.7 | 1,651.1 | 1,660.1 | (1.3) | 18.3 | 17.1 |
| පටු මුදල් සැපයුම (M1) | 1,768.4 | 2,038.6 | 2,079.8 | 13.9 | 17.7 | 17.6 |
| පුළුල් මුදල් සැපයුම (M2) | 12,121.5 | 13,165.6 | 13,337.4 | 10.5 | 9.4 | 10.0 |
| ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) | 13,747.9 | 14,965.5 | 15,175.8 | 9.8 | 9.9 | 10.4 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම්[ආ] | 180.2 | 945.5 | 889.6 | 122.3 | 906.5 | 393.6 |
| මුදල් අධිකාරීන් | (236.9) | 461.5 | 424.2 | 75.4 | 286.1 | 279.0 |
| වාණිජ බැංකු | 417.2 | 484.0 | 465.4 | 169.1 | 41.5 | 11.6 |
| දේශීය බැංකු ඒකක (DBUs) | (221.0) | (256.8) | (294.2) | 43.1 | -4.8 | -33.1 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 638.2 | 740.8 | 759.6 | 17.5 | 26.2 | 19.0 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ දේශීය වත්කම්[ආ] | 13,567.7 | 14,020.0 | 14,286.2 | 1.8 | 3.7 | 5.3 |
| රජයේ ණය ගැනීම් (ශුද්ධ)[ඇ] | 8,089.7 | 8,449.2 | 8,496.2 | -2.1 | 3.6 | 5.0 |
| මහ බැංකුව | 1,825.8 | 1,872.6 | 1,821.3 | (42.6) | 0.5 | (0.2) |
| වාණිජ බැංකු[ඇ] | 6,263.9 | 6,576.6 | 6,674.9 | 23.2 | 4.5 | 6.6 |
| දේශීය බැංකු ඒකක (DBUs)[ඇ] | 6,103.2 | 6,507.6 | 6,605.6 | 27.6 | 6.1 | 8.2 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 160.8 | 69.0 | 69.3 | (46.4) | (56.4) | (56.9) |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය | 709.4 | 638.0 | 636.8 | (35.7) | (9.0) | (10.2) |
| දේශීය බැංකු ඒකක (DBUs) | 655.3 | 585.4 | 584.1 | (37.5) | (9.6) | (10.9) |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 54.1 | 52.6 | 52.8 | (0.9) | (1.6) | (2.5) |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 7,512.4 | 8,634.6 | 8,856.1 | 6.2 | 16.1 | 17.9 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 6,961.0 | 8,045.6 | 8,256.4 | 6.2 | 16.5 | 18.6 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 551.4 | 588.9 | 599.7 | 6.0 | 10.3 | 8.8 |
| අනෙකුත් අයිතම (ශුද්ධ)[ආ] | (2,743.8) | (3,701.8) | (3,703.0) | 11.8 | (33.5) | (35.0) |












## 2.3 සංචිත මුදල් හා සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්

| | 2025-08-06 | 2025-08-14 |
|---|---|---|
| සංචිත මුදල් (රුපියල් මිලියන) | 1,732,298.58 | 1,733,505.76 |

| | 2025-08-07 | 2025-08-15 |
|---|---|---|
| සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් (රුපියල් මිලියන) | 1,505,274 | 1,508,471 |




## 2.4 මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් (දෛනික)

| ඒක්ෂණ මුදල් වෙළඳපොළ | 2025-08-11 | 2025-08-12 | 2025-08-13 | 2025-08-14 | 2025-08-15 |
|---|---|---|---|---|---|
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 7.86 | 7.85 | 7.85 | 7.85 | 7.86 |
| දළ වටිනාකම (රුපියල් බිලියන) | 21.25 | 22.85 | 26.93 | 28.00 | 49.28 |

| වෙළඳපොළ ප්‍රතිමිලදී ගැනුම් | 2025-08-11 | 2025-08-12 | 2025-08-13 | 2025-08-14 | 2025-08-15 |
|---|---|---|---|---|---|
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 7.86 | 7.86 | 7.86 | 7.86 | 7.86 |
| දළ වටිනාකම (රුපියල් බිලියන) | 52.94 | 47.10 | 43.20 | 62.42 | 82.91 |

## 2.5 ශ්‍රී ලංකා මහ බැංකුව සතු සුරැකුම්පත් ගොනුව

| | 2025-08-11 | 2025-08-12 | 2025-08-13 | 2025-08-14 | 2025-08-15 |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - මුහුණත අගය (රුපියල් බිලියන) | 2,508.9 | 2,508.9 | 2,508.9 | 2,508.9 | 2,508.9 |
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - පොත් අගය (රුපියල් බිලියන) | 1,562.2 | 1,562.0 | 1,562.8 | 1,562.1 | 1,569.8 |

(අ) තාවකාලික
(ආ) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) අදාළව
(ඇ) සංශෝධිත

## 2.6 විවට වෙළඳපොළ කටයුතු

| අයිතමය | 2025-08-11 | 2025-08-12 | 2025-08-13 | 2025-08-14 | 2025-08-15 |
|---|---|---|---|---|---|
| **කෙටි කාලීන වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| කාල සීමාව (දින ගණන) | - | - | - | - | - |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| **ස්ථිර පදනම මත වෙන්දේසි** | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම (රු. බිලියන) | - | - | - | - | - |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනුම් (රු. බිලියන) | - | - | - | - | - |
| පියවීමේ දිනය | - | - | - | - | - |
| පරිණත වන දිනය | - | - | - | - | - |
| කාල සීමාව (දින ගණන) | - | - | - | - | - |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| **දිගු කාලීන වෙන්දේසි** | | | | | |
| පිළිගත් ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| පියවීමේ දිනය | - | - | - | - | - |
| පරිණත වන දිනය | - | - | - | - | - |
| කාල සීමාව (දින ගණන) | - | - | - | - | - |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| **ද්‍රවශීලතා පහසුකම් වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| පියවීමේ දිනය | - | - | - | - | - |
| පරිණත වන දිනය | - | - | - | - | - |
| කාල සීමාව (දින ගණන) | - | - | - | - | - |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - | - |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - | - |
| **නිත්‍ය පහසුකම** | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම (රු. බිලියන) | 110.73 | 98.60 | 114.91 | 118.77 | 105.02 |
| නිත්‍ය ණය පහසුකම (රු. බිලියන) | 0.05 | 0.71 | 6.74 | 0.61 | 16.70 |
| | | | | | |
| **සමස්ත වෙළඳපොළ එක් දින ද්‍රවශීලතාව (රු. බිලියන)** | **110.68** | **97.89** | **108.18** | **118.16** | **88.33** |
| **සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව (රු. බිලියන)[අ]** | **110.68** | **97.89** | **108.18** | **118.16** | **88.33** |

(අ) සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාවෙන් නිරූපණය වන්නේ කෙටි කාලීන සහ දිගු කාලීන නොපියවූ ප්‍රතිමිලදීගැනුම්/ප්‍රතිවිකුණුම් ගණුදෙනු ගළපන ලද එක් දින ද්‍රවශීලතාවයි.

## 2.7 ණය කාඩ්පත් සහ වාණිජ පත්‍රිකා නිකුතු


### 2.7.1 ණය කාඩ්පත්[(අ)]


| | 2024 දෙසැම්බර් | 2025 මැයි[(ආ)] | 2025 ජූනි[(ඈ)] |
|---|---|---|---|
| මුළු සක්‍රීය කාඩ්පත් ගණන | 2,008,456 | 2,064,810 | 2,075,744 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 9,772 | 9,411 | 9,287 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 1,998,684 | 2,055,399 | 2,066,457 |
| නොපියවූ ශේෂය (රු. මිලියන) | 157,957 | 160,370 | 160,909 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 34,847 | 35,627 | 36,128 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 123,110 | 124,743 | 124,781 |

### 2.7.2 වාණිජ පත්‍රිකා නිකුතු[(ඇ)]

| | 2024 දෙසැම්බර් | 2025 මැයි | 2025 ජූන[(ආ)] |
|---|---|---|---|
| සමස්ත නිකුතුව (සමුච්චිත) - රු. බිලියන[(ඉ)] | 3.1 | 1.6 | 3.2 |
| නොපියවූ (කාලපරිච්ඡේදය අවසානය වනවිට) | 0.9 | 1.6 | 2.3 |


(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද
(ආ) තාවකාලික
(ඈ) සංශෝධිත
(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සපයන ලද දත්ත මත පදනම්ව
(ඉ) වසරේ මේ දක්වා එකතුව




## 2.8 කොටස් වෙළඳපොළ


| | 2024-08-15 | 2025-08-07 | 2025-08-15 |
|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) (ASPI) | 11,531.31 | 19,826.57 | 20,218.36 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය (2004 = 1,000) (S&P SL20) | 3,308.89 | 5,825.39 | 5,894.84 |
| දෛනික පිරිවැටුම (රු. මිලියන) | 776.06 | 3,263.76 | 9,540.01 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 4,563.32 | 6,940.23 | 7,121.51 |
| විදේශීය මිලදී ගැනීම් (රු. මිලියන) | 6.44 | 108.27 | 189.78 |
| විදේශීය විකිණුම් (රු. මිලියන) | 120.12 | 81.25 | 208.54 |
| ශුද්ධ විදේශ මිලදී ගැනීම් (රු. මිලියන) | (113.68) | 27.02 | (18.76) |



# රාජ්‍ය මූල්‍ය අංශය


## 3.1 රාජ්‍ය මූල්‍ය කටයුතු (රු. බිලියන)

| ශීර්ෂය | 2024 ජන. - ජුනි | 2025 (අ) ජන. - ජුනි |
|---|---|---|
| ආදායම් සහ ප්‍රදාන | 1,864.61 | 2,325.10 |
| ආදායම | 1,860.63 | 2,321.72 |
| බදු ආදායම | 1,709.31 | 2,152.09 |
| බදු නොවන ආදායම | 151.33 | 169.63 |
| ප්‍රදාන | 3.98 | 3.39 |
| වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණයදීම් | 2,463.31 | 2,730.71 |
| පුනරාවර්තන | 2,218.44 | 2,506.83 |
| ප්‍රාග්ධන වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණයදීම් | 244.86 | 223.88 |
| ප්‍රාථමික ශේෂය | 543.41 | 858.99 |
| සමස්ත අයවැය ශේෂය | (598.70) | (405.60) |




## 3.2 මධ්‍යම රජයේ නොපියවූ ණය (රු. බිලියන)(ආ)

| ශීර්ෂය | 2024(අ)(ඇ) අවසානයට | 2025(අ)(ඇ) අප්‍රේල් අවසානයට |
|---|---|---|
| සමස්ත දේශීය ණය (ඈ) | 18,309.66 | 18,629.86 |
| එයින් ; භාණ්ඩාගාර බිල්පත් | 4,061.55 | 3,961.75 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 14,079.20 | 14,619.75 |
| සමස්ත විදේශීය ණය (ඉ)(ඊ) | 10,429.04 | 10,850.53 |
| මධ්‍යම රජයේ සමස්ත නොපියවූ රාජ්‍ය ණය | 28,738.70 | 29,480.39 |





මූලයන් : මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව


